දිවි තොර කර ගැනීම් වාර්තා කිරීමේදී, අදාළ මාධ්‍ය මාර්ගෝපදේශයන් පිළිපැදීමේ අවශ්‍යතාවය වන්නේ, එම පුවත් වාර්තාවන් හේතුවෙන් දිවි තොර කර ගැනීමට නැඹුරු මානසික තත්ත්වයක් ඇති තවත් අයෙකු අනුකාරක දිවි තොර කර ගැනීමකට පෙළඹීමේ ඉඩක් නැති කිරීමටයි. පර්යේෂණ මගින් පෙන්වා දෙන්නේ, නිසි ප්‍රවේශමකින් තොරව ඉදිරිපත් කරන දිවි තොර කර ගැනීම් සම්බන්ධ පුවත් හේතුවෙන්, අනුකාරක දිවි තොර කර ගැනීම් පැතිර යා හැකි බවයි.

එප්පාවල සඳරුස්ගම ප්‍රදේශයේ තරුණයකු අගෝස්තු 02, 2023 දින දිවි තොර කරගෙන ඇති බවට වන පුවත මාධ්‍ය වාර්තා කිහිපයකම සඳහන් වී තිබිණි. එකම පවුලක සහෝදර සහෝදරියන් හත්දෙනෙකුගෙන් පස්දෙනෙකු අවස්ථා කිහිපයකදී දිවි තොර කර ගෙන ඇති බවත්, මේ දිවි තොර කර ගෙන ඇත්තේ එයින් පස්වැන්නා බවත් මෙම පුවත් වාර්තාවන් තුළම වැඩිදුරටත් සඳහන් වී තිබිණි.

මෙහිදී මෙම පුවත වාර්තා කර තිබූ අරුණ, දිනමිණ, දිවයින පුවත් වාර්තාවන් තුළ,

* දිවි තොර කර ගත් ආකාරය දක්වා තිබිණි.
* මෙම පවුලේ මීට පෙර සිදු වූ දිවි තොර කර ගැනීම සම්බන්ධයෙන් ද, ප්‍රමුඛත්වය කින් යුතුව සිරස්තල තුළ ම සඳහන් කර තිබිණි.
* හදිසි උපකාරක අංක සඳහන් කර නොතිබුණි.

එසේ බලන විට මෙම එක් පුවත් වාර්තාවක් හෝ වගකීම් සහගත යැයි අපට කිව නොහැක.

මෙවැනි පුවත් වාර්තා කිරීමේදී අඩු තරමින් උපකාරක අංක සඳහන් කිරීමට හෝ මාධ්‍ය සැලකිලිමත් වන්නේ නම්, දිවි තොර කරගැනීමට නැඹුරුතාවයක් ඇති අයෙකු උපදේශනය වෙත යොමු කරවා, ජීවිතයක් බේරා ගැනීමට හැකියාවක් ලැබෙනු ඇත.

එය මාධ්‍ය ආචාරධර්ම පිළිපැදීමත් මෙන්ම සමාජ වගකීමක් බවද අපි මෙසේ ම සඳහන් කරමු.

උපකාරක අංක පළ කරමු, ජීවිතයක් රැක ගනිමු!

හදිසි උපකාරක අංක:

*CCCline - 1333
*ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0707308308
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

(මෙම දිනයේ මෙම පුවත්පත්වල සහෝදර ඉංග්‍රීසි පුවත්පත් තුළ මෙම සිදුවීම සම්බන්ධයෙන් වාර්තා වී නොතිබුණි.)

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!